4.16.3 සිංහල/ දෙමළ භාෂාව ගණිතය හා පෙරදිග නැටුම්/ භරත නැටුම් ඇතුළු විෂයයන් 06කින් අ.පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

(සැළකිය යුතුයි (i) ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2006 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ. පෙ.) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ.පො. ස. (සා.පෙ.) විභාගයේ දී භරත නැටුම් විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.)

**4.17 පාඨමාලා අංකය 17 – සංගීතය (පෙරදිග) / සංගීතය (කර්ණාට)**

4.17.1. 2006 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙ.) විභාගයේ දී පෙරදිග සංගීතය/ කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් තුනකින් (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට විෂය දෙකකින් ) එකවර සමත්වීම ; හා

4.17.2 2006 වසරේ අ.පො. ස. ( උ.පෙ.) විභාගයේ දී සංගීතය(පෙරදිග) සංගීතය (කර්ණාට) විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.17.3 සිංහල / දෙමළ භාෂාව, ගණිතය හා පෙරදිග සංගීතය / කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් 06කින් අ.පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

(සැළකිය යුතුයි (i) ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2006 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙ.) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී කර්ණාට සංගීතය විෂයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.)

**4.18. පාඨමාලා අංකය 18 - බටහිර සංගීතය**

4.18.1 2006 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී බටහිර සංගීතය ඇතුළු විෂයයන් තුනකින් එකවර සමත්වීම ;

හා

ඉංග්‍රීසි භාෂාව සම්මාන / ඉංග්‍රීසි සාහිත්‍යය විෂය සාමාන්‍ය සාමාර්ථයක් ද සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සමත්වීම ;

හෝ

4.18.2 2006 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් එකවර සමත්වීම ;

හා

ඉංග්‍රීසි භාෂාව සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍ය විෂය සාමාන්‍ය සාමාර්ථයක් ද සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු විෂයයන් 6කින් අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සමත්වීම ;

හා

අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනයක බටහිර සංගීතය පිළිබඳව පස්වැනි පන්තිය සමත්වීම (න්‍යායික හා ප්‍රායෝගික).

හෝ

අ.පො.ස. (උ.පෙ) බටහිර සංගීතය විෂය අමතර විෂයයක් ලෙස සමත්ව තිබීම.

(සැළකිය යුතුයි (i) බටහිර සංගීත පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී සතුටුදායක කුසලතා මට්ටමකට ලඟා වීම.

(ii) මෙම පාඨමාලාවට තෝරාගැනීමේ දී ඉහත 4.18.1 යටතේ සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව දෙනු ලැබේ.)

**4.19 පාඨමාලා අංකය 19 - නාට්‍ය හා රංග කලාව**

4.19.1 2006 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව ඇතුළුව විෂයයන් 03 කින් සමත්වීම; හා

4.19.2 සංගීතය හෝ නැටුම් හෝ චිත්‍ර, හෝ නාට්‍ය හා රංග කලාව ද, ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද ඇතුළු විෂයයන් 6 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම.

4.19.3 2006 වසරේ අ.පො.ස. (උ. පෙ.) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.20 පාඨමාලා අංකය 20 - තොරතුරු සන්නිවේදන තාක්ෂණය

4.20.1 2006 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යාපීඨයට විෂයයන් දෙකකින්) එකවර සමත්වීම; හා

4.20.2 ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතයට සම්මාන සාමාර්ථයන් ද සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම.

4.21 පාඨමාලා අංකය 21- සාමාජීය විද්‍යාව (සිංහල)

21- සාමාජීය විද්‍යාව (දෙමළ)

21- සාමාජීය විද්‍යාව (ඉංග්‍රීසි)

4.21.1 2006 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී ඉතිහාසය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව සහ ආර්ථික විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එකවර විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉහත විෂයයන් දෙකකින්) එකවර සාමාර්ථ්‍යය ; හා

(2009 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට බඳවා ගැනීමේ දී ඉතිහාසය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව යන විෂයයන් තුනෙන් එකක් ඇතුළුව එකවර විෂයයන් තුනකින්, ශ්‍රී පාද විද්‍යාපීඨය සඳහා එම විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයයන් දෙකකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්වීම අවශ්‍ය වේ.)

4.21.2 සමාජ අධ්‍යයනය හා ඉතිහාසය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

4.22 පාඨමාලා අංකය 22 - පළමුබස (දෙමළ)

4.22.1 2006 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට විෂයයන් දෙකකින්) එකවර සමත්වීම; හා

4.22.2 දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථය සහ ගණිතය ඇතුළු විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

4.23 පාඨමාලා අංකය 23 - දෙවන බස (සිංහල)

4.23.1 දෙවන බස (සිංහල) පාඨමාලාව අයදුම්කරුවන් 2006 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී සිංහළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් 3 කින් සමත්වීම ;

හා

4.23.2 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන භාෂාව දෙමළ විෂය සමත්වීම හෝ වෛකල්පිත දෙමළ විෂය සමත්වීම.

ඉහත 4.23.2 සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවක් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව උසස් පාඨමාලාව දෙමළ විෂය සමත් වීම සුදුසුකමක් ලෙස සැලකේ.

4.23.3 සිංහල භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්වීම.

4.24. පාඨමාලා අංකය 24 - දෙවන බස (දෙමළ)

4.24.1 දෙවන බස (දෙමළ) පාඨමාලාව අයදුම්කරුවන් 2006 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් 3කින් සමත්වීම ;

හා

4.24.2 අ. පො. ස. (සා. පෙ.) විභාගයේ දී දෙවන භාෂාව සිංහල විෂය සමත් වීම හෝ වෛකල්පිත සිංහල විෂය සමත්වීම.

ඉහත 4.24.2 සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව උසස් පාඨමාලාව සිංහල විෂය සමත්වීම සුදුසුකමක් ලෙස සැලකේ.

4.24.3 දෙමළ භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත් වීම.

5.0 පාඨමාලා අංකය, පාඨමාලාවේ නම, මාධ්‍ය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය එහි අංකය සහිතව පහතින් දැක්වේ.

## සංශෝධනය

විදේශ කටයුතු අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවක පුරප්පාඩු පිරවීම සඳහා වූ තරග විභාගය

ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවක පුරප්පාඩු පිරවීම සඳහා වූ තරඟ විභාගයට අයදුම් පත් කැඳවමින් නිකුත් කරන අංක 1,499 හා 2007.05.25 දිනැති *ගැසට් නිවේදනය* පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

2. *යෝග්‍යතාවය* :
අංක 2 ආ (I) ඡේදයේ සඳහන් උපරිම වයස් සීමාව අවුරුදු 56 වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

මින් පෙර ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල සේවය කර ලංකාවට නැවත පැමිණීමෙන් පසු අවම වශයෙන් වසර 02 ක කාලයක් සම්පූර්ණ කළ තිබිය යුතුය, යනුවෙන් සඳහන් 2 ඡේදයේ සටහන් යටතේ වූ අංක (ii) උප ඡේදය ඉවත් කරනු ලැබේ.

5. *අයදුම් කරන ආකාරය* :
5.2 ඡේදයේ සඳහන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2007.07.09 දින වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

ටී. බී. මඩුවේගෙදර
*වැඩ බලන* විදේශ කටයුතු ලේකම්.

06-15

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.